# පඬුවස්නුවර කුඹල් ග්‍රාමය ආශ්‍රයෙන් කෙරෙන මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක්

එල්.ඩී. ගයාන් දිලීප් බණ්ඩාර[1], එච්.එම්. බවන්ත හේරත්[2]

කුඹල් කර්මාන්තය හෙවත් මැටි කර්මාන්තය, කෘෂිකාර්මික දිවි පෙවෙතකට පුරුදුව සිටි පැරණි ලාංකිකයන් තම දෛනික අවශ්‍යතා සඳහා උපයෝගී කරගත් ක්ෂේත්‍රයකි. මෙයට දීර්ඝ ඉතිහාසයක් පවතින බව පුරාවිද්‍යාත්මක සාධක මගින් සනාථ කරගෙන තිබේ. මිනිසා දඩයම හා එක්රැස් කිරීමේ ජීවන රටාව ගෙවමින් ගොවි යුගයේදීත් ඉන් පසු බිහි වූ ශිෂ්ටාචාර තුළත් දෛනිකව අවශ්‍ය භාණ්ඩ හා උපකරණ නිර්මාණය කරගැනීමට යොමුවීම නිසා මැටි භාණ්ඩ භාවිතය වර්ධනය වූ බවට සාධක හමුවේ. මෙම අධ්‍යයනයේ දී මූලික දත්ත රැස්කිරීම ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් සිදු වූ අතර සම්මුඛ සාකච්ඡා පැවැත්වීම තුළින් ද තොරතුරු ලබාගන්නා ලදි. ක්ෂේත්‍ර නොවන අධ්‍යයන මගින් ද, සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය කිරීමෙන් ද, අන්තර්ජාලය ඇසුරු කරගනිමින් ද තොරතුරු රැස්කිරීම සිදුවිය. කුඹල් වංශය, කුම්බකාර, බඩසැල හා බඩහැල නමින් ද හඳුන්වන අතර, අන් කිසිම කුලයකට නොදෙවැනි වූ සම්භාව්‍ය ඉතිහාසයක් ශ්‍රී ලංකාවේ කුඹල් කුලයට ඇති බව මානවවිද්‍යාඥයන් පමණක් නොව, සමාජවිද්‍යාඥයන්ගේ ද පිළිගැනීමයි. සිය නිෂ්පාදන සඳහා මැටි කපාගැනීම, සකපෝරු ක්‍රියාත්මක කිරීම ආදී කරුණු සඳහා සුබ නැකත් තෝරාගන්නා කුඹලා සිය නිෂ්පාදන සඳහා විවිධ මැටි වර්ග තෝරා ගනී. හැලි, වලං, කළගෙඩි, පිඟන් කෝප්ප පමණක් නොව ධාතු කරඬු, පූජා භාණ්ඩ ද නිපද වූ අතර, ඈත අතීතයේ මලමිනී බහාලන මංජුසා ආදියත්, මිනී මංජුසා ආදියත් නිපදවා ඇත. මහාවංසය, ථූපවංසය, පාලි බෝධිවංසය, පූජාවලිය ආදී ලිඛිත ග්‍රන්ථ හා ජනප්‍රවාද ආදිය තුළින් මේ පිළිබඳව තොරතුරු හඳුනාගත හැකි වේ. මෙලෙසින් අතීතයේ සිටම අද දක්වා මැටි මෙවලම් කර්මාන්තය ආරක්ෂා වී පවත්නා ගම්මානයක් ලෙසට වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඬුවස්නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අඹගහවැව ගම්මානය හඳුන්වාදිය හැකිය. මෙම ගම්මානය පණ්ඩුකාභය රජ දවසටත් ඔබ්බට ගිය අතීත උරුමයක් ශේෂව පවතී. වර්තමානයේ දී පවුල් 300 ක් පමණ ජීවත් වන අතර, වැඩි වශයෙන්ම පාරම්පරික කාර්යයන් ඉටු කරනුයේ පවුල් 200 ක් පමණ පිරිසකි. මෙහි දී අඹගහවැව ගම්මානය ආශ්‍රිතව සම්ප්‍රදායික කුඹල් කර්මාන්තය වර්තමානයේ දී නැති වී යාමට හේතු මොනවා ද? ඒ සඳහා පවතින ගැටළු මොනවා ද? යන පර්යේෂණ ගැටළු පාදක කරගනිමින් මානවවංශ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදි.

ප්‍රමුඛ පද : කුඹල් කර්මාන්තය, පඬුවස්නුවර, මානවංශ පුරාවිද්‍යාව, සංස්කෘතිය, සමාජය

[1] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. gayandileep06@gmail.com
[2] බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. bawanthaherath853@gmail.com